# බුදුරජාණන් වහන්සේගේ මාංශ ආහාරය

ත්‍රිපිටකවේදී උපාධි අපේක්ෂක
බණ්ඩාරවෙල විමලධම්ම හිමි

බුදුරජාණන් වහන්සේ පරම අවිහිංසාවාදියෙකි. උන්වහන්සේගේ දහම සකල සත්වයා කෙරෙහි පතළ මහාකරුණාවෙන් සකස් වූවකි. අවිහිංසා දහමක් මුල් කරගෙන පෝෂණය වුණු බෞද්ධ භික්ෂූන් වහන්සේත් පරම අවිහිංසාවාදී වූ බුදුරජාණන් වහන්සේත් මස් මාංශ අනුභව කිරීම සුදුසුවන්නේදැයි සැකයක් මතුවේ. මේ පිළිබඳව ත්‍රිපිටකාගත කරුණු අනුව විමසා බලන්නකුට බුදුරජාණන් වහන්සේ නිර්මාංශිකයෙකැයි ප්‍රකාශ කිරීමට කිසිසේත් ඉඩක් නැත. බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවකයන්ට නිර්මාංශ විය යුතුයැයි දේශනා කළ තැනක්ද දක්නට නැත.

දෙව්දත් තෙර වර පහක් ඉල්වමින් භික්ෂූන් වහන්සේ ජීවිතාන්තය දක්වා මස්මාංශයෙන් තොර විය යුතු යැයි ශික්ෂාපදයක් පනවන ලෙස බුදුරජාණන් වහන්සේගෙන් ඉල්විය. එහෙත් බුදුරජාණන් වහන්සේ එම අදහස ප්‍රතික්ෂේප කළ සේක. කැමති කෙනකු මස්මාංශ පරිභෝජනය කළාට වරදක් නැතැයිද කැමති කෙනකු මස් මාංශයන්ගෙන් තොරවූවාටද වරදක් නැතැයිද දේශනා කළ සේක.

බුදු රජාණන් වහන්සේ මස් මාංශ අනුභව කිරීමට විරුද්ධත්වයක් දැක්වූයේ නම් මෙම සහනශීලි ප්‍රතිපදාව අනුගමනය නොකරනු ඇත.

එසේ වුවද ශිෂ්ට සමාජයට උචිත වන අයුරින් අනුභව නොකළ යුතු මාංශ වර්ග 10 ක් මහා වග්ග පාළියේ භෙසජ්ජක්ඛන්ධකයෙහි දක්වා ඇත. මෙම කරුණම පාළිමුත්තක විනය විනිශ්ච යෙහි මෙසේ දැක්වේ. '' මංසෙසු පන මනුස්ස හත්ථි අස්ස සුනඛ අහිසීහ ව්‍යග්ඝ දීපි අච්ඡ තරච්ඡානං වසෙන දස මංසානි අකප්පියානියි.''

අකැප මස් වර්ග 10 මෙසේ දක්වමින් භික්ෂූන් වහන්සේට වැළඳීමට කැප සරුප් මාංශයද මහා වග්ග පාළියෙහිම දක්වා ඇත. එනම්, ''අනුජානාමි භික්ඛවේ තිකොටිකපාරිසුද්ධි මංසං අදිට්ඨං අසුතං අපරිසඞ්කිතං '' යනුවෙනි. අදිට්ඨ නම් තමා උදෙසාම සතකු මැරූ බව නොදැකීමයි. අසුතං යනු තමා උදෙසා සතකු මැරූ බව නො ඇසීමයි. අපරිසඞ්කිතං යනු තමා උදෙසා සත්ව හිංසාව කළේ යැයි සැකයක් නැති බවයි. මේ අයුරින් පරිශුද්ධ වූ මාංශය අනුභව කිරීම බෞද්ධ භික්ෂූන් වහන්සේට සුදුසු බව අනුදැන වදරා ඇත.

බුදුරජාණන් වහන්සේ චුන්ද ගෘහපතියා විසින් පිළිගන්වනු ලැබූ සූකර මද්දවය වැළඳීම නිසා එතෙක් යටපත්ව තිබූ රෝගය උස්සන්නව පිරිනිවන් පෑ බව පරිනිර්වාණ සූත්‍රයේ සඳහන් වේ. බුදුරජාණන් වහන්සේ වැළඳූ මෙම සූකර මද්දවය පිළිබඳව බුද්ධඝෝෂ හිමියන්ටද නිශ්චිත අවබෝධයක් තිබුණු බවක් දක්නට නොමැත. සූකර මද්දවය පිළිබඳ බුද්ධඝෝෂ හිමියන් අදහස් තුනක් ඉදිරිපත් කර ඇත. එනම්,

1. සූකර මද්දවය යනු ළපටි නොවූත් මහලු නොවූත් තරුණ ඌරකුගේ මස්යැයිද,

2. පංච ගෝරසයෙන් සකස් කර ගන්නා ලද මෘදු ආහාරයක් යැයිද,

3. රසායන බෙහෙතක් යැයිද දක්වා ඇත.

මේ කරුණු තුනෙන් දෙවෙනි තුන්වෙනි කරුණු සූකර මද්දවය ඌරුමස් නොවේ යැයි ඇඟවීමට යොදා ඇත. උදනට්ඨකථාවේද සූකර මද්දවය යනු ඌරු මස් නොවේ යැයි තරයේම දක්වා ඇත.

කැප අකැප මාංශ දක්වා තිබියදීත් අකැප මාංශ වර්ගවලට ඌරුමස් ඇතුළත් නොවී තිබියදීත් සූකර මද්දවය පිළිබඳ මතභෙද ඇති වූයේ කවර හෙයින් දැයි නොදත හැකිය. කෙසේ වුවද මේ මත භේදය මුල් අවධියේම ඇතිවී පරම්පරාවෙන් පැවත ආ බව නම් සිතිය හැකිය.

ඇසුරු කළ පොත්:—


1. පාලි මුත්තක විනය විනිශ්චය
2. මහාවග්ග පාළි
3 දීඝ නිකාය
4. සුමංගල විලාසිනි
5. උදනට්ඨකථා